# සාම්ප්‍රදායික සංචරණයෙන් ඔබ්බට සංස්කෘතික සංචරණය දියත් කිරීම පිළිබඳ අධ්‍යයනයක්

**සමරදිවාකර ආර්.**[1]

ශ්‍රී ලංකාව ඉහළ සංචාරක ආකර්ෂණයක් සහිත රාජ්‍යකි. එහි ගාලු පුරවරය යනු සංචාරක කර්මාන්තය ප්‍රධාන වශයෙන් වෙරළ තීරය හා ගාලු ඕලන්ද බලකොටුව පදනම් කොටගෙන නිර්මාණය වූවකි. එහෙත් මෙම සාම්ප්‍රදායික ක්‍රමයෙන් ඔබ්බට සංචාරක කර්මාන්තය ව්‍යාප්ත කිරීම තුළින් අප්‍රසිද්ධ සංස්කෘතික සංචාරක ස්ථානයන් කෙරෙහි ද අවධානය යොමු වේ. සජීවී ලෝක උරුම නගරයක් වන ගාල්ලෙහි, කඩවත්සතර කලාපය තුළ පමණක් ම විවිධ වූ අගනාකම් සහිත උරුම ස්ථානයන් වෙත අවම සංචාරක අවධානයක් යොමු වී ඇති බව පෙනේ. ඒ අනුව ඓතිහාසික ගාලු පුරවරය ඉලක්ක කොට ගනිමින් සංස්කෘතික උරුමයන් නැරඹීමට පැමිණෙන සංචාරකයින්හට තෝරාගත් උරුම ස්ථානයන් ප්‍රවර්ධනය කිරීම සඳහා, සංචාරක කළමනාකරණ සැලැස්මක් යටතේ සංස්කෘතික උරුමය මනා සැලැස්මකට අනුව නිර්මාණය කරන්නේ කෙසේ ද යන පර්යේෂණ ගැටලුව කෙරෙහි මෙහිදී අවධානය යොමු කෙරෙයි. පර්යේෂණය සඳහා ගාලු කොටුව තුළ බහුතර සංචාරක අවධානයට ලක් නොවුණු කළු කොටුව සහ මෙම බලකොටුවේ සිට පහසුවෙන් ළඟා විය හැකි සමුද්‍රීය උරුම ක්ෂේත්‍රයන් හා මිනුවන්ගොඩ පරමානන්ද පුරාණ විහාරය, තුවක්කුගලවත්ත රජමහ විහාරය කෙරෙහි අවධානය යොමු කොට අධ්‍යයනය සිදු කරන ලදි. මෙම සංස්කෘතික උරුම ස්ථාන කරා සංචාරක ආකර්ෂණය ප්‍රවර්ධනය කිරීම, මේ ආශ්‍රිත උරුමයන් ඇගයීම හා සංචාරකයින්ට ඔබින ආකාරයට සංචාරක කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම මෙහිදී ප්‍රමුඛ අරමුණු වේ. මෙම පර්යේෂණය සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි ඉදිරිපත් කර තොරතුරු ලබා ගැනීම, අන්තර්ජාල භාවිතය ඔස්සේ තොරතුරු අධ්‍යනය සිදු කරන ලදි. මෙහිදී තෝරාගත් උරුම ස්ථානයන්ගේ අගයන් හඳුනා ගැනීම යටතේ මෙම උරුම ස්ථානයන් සියල්ලක්ම පාහේ මෙරට අධිරාජ්‍යවාදී යුගයන් සමඟ මොනයම් හෝ සබඳතාවක් තිබී ඇති බව පසක් විය. වාස්තු විද්‍යාත්මක, කලාත්මත හා සෞන්දර්යාත්මක සුවිශේෂී අගයන් මෙම උරුමයන් සතු වේ. මෙවැනි සංචාරක ආකර්ෂණයක් දිනා ගත හැකි ස්ථානයන් පිළිබඳව සංචාරකයින්ගේ දැනුවත් භාවය ඉතා අල්ප බව මෙම පර්යේෂණයේ දී හෙළි විය. මේ සඳහා හඳුනාගත් සුවිශේෂී අගයන් නිසි පරිදි කළමනාකරණය, වගකිව යුතු ආයතනයන්ගේ මැදිහත් වීම මේ සඳහා යොමු කිරීම මෙන්ම සංස්කෘතික සංචාරක උපායමාර්ග සැලසුම්කරණය, සංචාරක සංවර්ධන ප්‍රතිපත්ති ගොඩනැගීම කෙරහි අවධානය යොමු කරනු ලැබීය. තවද තෝරාගත් සංස්කෘතික උරුම ස්ථානයන් පිළිබඳ ප්‍රචාරණ කටයුතු සිදු කිරීම, සංචාරක ආකර්ෂණය වැඩි වන ආකාරයේ ක්‍රියාකාරකම් සිදු කිරීම පිළිබඳව නව උපක්‍රමයන් දැක්වීම මෙම පර්යේෂණයේදී සිදු කරනු ලැබුණි. මෙලෙස මෙම උපායමාර්ගයන් අනුගමනය කිරීම හරහා මෙම බහුතර සංචාරක අවධානය ලක් නොවුණු උරුම ක්ෂේත්‍රයන් වෙත සංචාරක ආකර්ෂණය යොමු වීම, එම උරුමයන් නඩත්තු වීම හා ආර්ථිකමය වශයෙන් විශාල විදේශ විනිමයක් ඉපැයීමේ හැකියාව ලැබේ.

**ප්‍රමුඛ පද** 💻 සංචාරක කර්මාන්තය, උපායමාර්ග, සැලසුම්කරණය, ප්‍රවර්ධනය, ආකර්ෂණය

---

[1]ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. vihangaravindi97@gmail.com